# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1579 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திக / Date – 14/10 /2024 පැය 0730

## මාධ්‍ය නිවේදනය

### විදේශ ජාතිකයින් පිරිසක් අත්අඩංගුවට

01. 2024.10.13 වන දින සවස් කාලයේ මහනුවර පොලිස් වසමේ අනිවත්ත ප්‍රදේශයේදී මහනුවර පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත හෝටලයක සැකසහිත ලෙස ලැගුම් ගෙන සිටි **චීන ජාතික පිරිමි පුද්ගලයින් 15 දෙනෙකු හා චීන ජාතික කාන්තාවක්** අත්අඩංගුවට ගෙන ඇත.

    මීට පෙර එනම් 2024.10.12 වන දින දහවල් කාලයේදී පල්ලෙකැලේ පොලිස් වසමේ නත්තරන්පොත ප්‍රදේශයේදී මහනුවර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත හෝටලයක සැකසහිත ලෙස ලැගුම් ගෙන සිට **චීන ජාතිකයින් 126 ක්, වියට්නාම ජාතිකයින් 02 ක්, තායිලන්ත ජාතිකයෙකු හා පිලිපීන් ජාතිකයෙකු ඇතුලු විදේශ ජාතිකයින් 130 දෙනෙකු** අත්අඩංගුවට ගෙන මහනුවර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

    ඒ අනුව 2024.10.13 වන දින මහනුවර පොලිස් ස්ථානය මගින් අත්අඩංගුවට ගත් චීන ජාතිකයින් 16 දෙනා මීට පෙර මහනුවර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය මගින් අත්අඩංගුවට ගත් චීන ජාතිකයින් සමග සම්බන්ධතාවයක් පවතිද යන්න පිළිබඳව විමර්ශන සිදුකරමින් පවතී.

02. 2024.10.13 වන දින දහවල් කාලයේ වැලිකඩ පොලිස් වසමේ ඇතුල්කෝට්ටේ ප්‍රදේශයේදී වැලිකඩ පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මහල් නිවාස සංකීර්ණයක් තුල සැකසහිත ලෙස ලැගුම් ගෙන සිටි **චීන ජාතික පිරිමි පුද්ගලයින් 11 දෙනෙකු හා චීන ජාතික කාන්තාවන් 04 දෙනෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

    මෙම සිද්ධීන් සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් සිදු කිරීමට නියමිතව ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**